අග්‍රාමාත්‍ය කාර්යාලය - සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය
பிரதம அமைச்சர் அலுவலகம் - நல்லிணக்க பொறிமுறைகளை ஒருங்கிணைப்பதற்கான செயலகம்
Prime Minister's Office - Secretariat for Coordinating Reconciliation Mechanisms

**මාධ්‍ය නිවේදනය: හානිපූරණය සඳහා වන කාර්යාලය සඳහා කොමසාරිස්වරුන් පත් කිරීම**

2019 අප්‍රේල් 04

පාර්ලිමේන්තුව විසින් 2018 ඔක්තෝබර් 09 වන දින, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත සම්මත කරන ලද අතර කොමසාරිස්වරුන් පත් කිරීමත් සමගම මෙම කාර්යාලය ක්‍රියාත්මක වීම ආරම්භ වනු ඇත.

හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනාගැනීම සඳහා සහ එම තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ලබාදීම හානිපූරණය සඳහා වන කාර්යාලයට පැවරෙන වගකීම වෙයි. ශ්‍රී ලංකාව විසින් දේශීය වශයෙන් නිර්මාණය කොට ක්‍රියාත්මක කරන සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ යාන්ත්‍රණයන්හි දෙවන පියවර මෙය වෙයි.

හානිපූරණය සඳහා වන කාර්යාලය උදෙසා කොමසාරිස්වරුන් පත් කොට ඇත්තේ තුන් වසරක ධුර කාලයකටය. එම කොමසාරිස්වරු පහත පරිදිය.

1. **ධාරා විජයතිලක මිය -** සභාපතිනිය
2. **ඒ. ඒ. එම්. ෆතිහු මහතා -** සාමාජික
3. **කර්නල් රත්නප්‍රිය බන්දු මහතා (විශ්‍රාමික) -** සාමාජික
4. **ආචාර්ය ජේ.එම් ස්වාමිනාතන් මහතා -** සාමාජික
5. **සුමිත්‍රා සෙල්ලතම්බි මිය -** සාමාජිකා

රජය විසින් 2019 වසර සඳහා වූ අය-වැය යෝජනා මගින් හානිපූරණය සඳහා වන කාර්යාලය උදෙසා රුපියල් මිලියන 700 ක් හෙවත් රුපියල් කෝටි 70ක් (රුපියල් 700,000,000 ක් ) වෙන් කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් විවෘත තරගකාරී ක්‍රමයක් මගින් තෝරා ගත් කොමසාරිස්වරුන්ගේ නාම යෝජනා ගරු ජනාධිපතිතුමන් වෙත පත් කිරීම සඳහා යොමු කර ඇත.

හානිපූරණය සඳහා වන කාර්යාලය පාර්ලිමේන්තුවට වගකියන ස්වාධීන ආයතනයක් වෙයි. ශ්‍රී ලංකාවේ හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනාගැනීම සඳහා සහ එම තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමට, හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර කැබිනට් මණ්ඩලයට නිර්දේශ කිරීම, සහ ඔවුන්ගේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අගය කිරීම මෙම හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුණුවේ.

මනෝ තිත්තවැල්ල
මහ ලේකම්
සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය

19 වැනි මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, 33 පාර්ක් වීදිය, කොළඹ 02. ශ්‍රී ලංකාව
19 ம் மாடி, பார்க்லேண்ட், இல. 33, பார்க் வீதி, கொழும்பு - 02, இலங்கை
Level 19, No. 33, Park Land, Park Street, Colombo-02, Sri Lanka.
දුරකථන / தொலைபேசி /Phone: +94112336840
ෆැක්ස් / தொலைநகல்/ FAX: +94112336912
ඊ මේල් /மின்அஞ்சல்/Email: contact@scrm.gov.lk